# නීලගිරි චෛත්‍යයේ ඓතිහාසික පසුබිම පිළිබඳ අධ්‍යයනයක්

සිරිලාල්. කේ.එම්

පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය. sirilalkonara@gmail.com

ප්‍රමුඛ පදඃ නීලගිරි චෛත්‍යය, ඓතිහාසික වටිනාකම, පුරාවිද්‍යාත්මක සාධක, බෞද්ධ උරුමය

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ වාණිජ අග නගරය වන කොළඹ සිට කිලෝමීටර් 324 ක දුරින් පිහිටි නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කයේ ලාහුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ලාහුගල රක්ෂිතයේ ඓතිහාසික නීලගිරි චෛත්‍යය පිහිටා තිබේ. පුරාණ රෝහණ දේශයේ නැගෙනහිර මායිමේ කැළෑව තුළ සැඟ වී ගත් නීලගිරි සෑය හා නටබුන් වර්තමානයේ ඝන කැළෑවක හුදකලා වී තිබුන ද අවට පවතින පුරාවිද්‍යාත්මක සාධක තහවුරු කරනුයේ එවකට හුදකලා නොවූ ජනාකීර්ණව හා සශ්‍රීකව පැවති ස්ථානයක් බවය. දසක තුනක යුදමය වතාවරණය තුළ අවධානයක් යොමු නොවුණු නැගෙනහිර පුරාවිදාත්මක වටිනාකම ලොවට කියාපෑමට රජගල, දීඝවාපිය යන පෞරාණික ස්ථාන මෙන්ම නීලගිරි චෛත්‍යය ද ප්‍රාමාණික කරගත හැකි ය. විහාරාරාම සංකීර්ණ නටබුන්, සෙල්ලිපි, නටබුන් වූ ස්තූප, කැටයම්, සිතුවම් සහිත ලෙන් හා ගල් කණු, ගල් කොරි අනෙකුත් පුරාවිද්‍යාත්මක සාධක ඒ බව ප්‍රත්‍යක්ෂ කරවයි. පුරාවිද්‍යාත්මක උරුමය තුළ නීලගිරි චෛත්‍යය වටිනාකම කෙබඳුවේ ද යන්න පර්යේෂණ ගැටළුව තුළ නීලගිරි චෛත්‍යය හා ඒ ආශ්‍රිත පුරාවිද්‍යාත්මක සාධක මතින් මෙහි ඓතිහාසික සහ පුරාවිද්‍යාත්මක වටිනාකම අධ්‍යයනය කිරීම අරමුණු කොට ගෙන පර්යේෂණය සිදු කෙරිණි.

## ක්‍රමවේදය

දත්ත එක්රැස් කිරීමේ දී ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් වංශකතා, ශිලා ලේඛන ද ද්විතීයික මූලාශ්‍රය වශයෙන් මේ සම්බන්ධයෙන් සාකච්ඡා කෙරෙන වෙනත් කෘති වඩාත් සාධනීය විය. එමෙන්ම ස්ථානීය ගවේශනය තුළින් සහ පූර්ව පර්යේෂණ මඟින් වඩාත් ප්‍රත්‍යක්ෂ සාධක උකහාගත හැකිවිය. දත්ත විශ්ලේෂණයේ දී ඓතිහාසික සාහිත්‍යය මූලාශ්‍රය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය විශ්ලේෂණයේ යෙදි සමස්ත පර්යේෂණ සීමාව ලෙස නිලාගිරි චෛත්‍යය සහ ඒ ආශ්‍රිත පුරාවිද්‍යාත්මක සාධක උපයෝගි කර ගැනිණි.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

යථොක්ත ක්‍රමවේදය ඇසුරින් රැස්කර ගත් දත්ත විශ්ලේෂණයේ දී ශ්‍රී ලාංකේය ඉතිහාසයේ සැලකිය යුතු කාල වකවානුවක මෙය නිර්මාණය වී තිබේ. විශේෂයෙන් ම සාහිත්‍යය හා පුරාවිද්‍යා මූලාශ්‍රය තුලනාත්මකව සැසඳීමේ දී චෛත්‍යය නාමය විවිධාර්ථයෙන් හඳුන්වා ඇති බව තහවුරු කරගත හැකිවිය. මෙහි ගවේෂණයේ නිරත මහාචාර්ය සෝමදේව ඇතුළු පිරිස අපර බ්‍රාහ්මී අක්ෂරයෙන් ලිය වී ඇති සෙල්ලිපියකට අර්ථකථන සපයමින් ශ්‍රී ලාංකේය රාජ නාමාවලියේ සැඟව සිටි ''මහා රාජිනි චුල සීවලි දේවි'' නම් රැජණක් ගැන ද වර්තමානයේ නිලාගිරිය ලෙස හඳුන්වන චෛත්‍යය එදා '' උත්තර සීවලි පබ්බත '' ලෙස හඳුන්වා

ඇති බවද අනාවරණයක යෙදී තිබේ. නමුත් මේධානන්ද හිමි තම නැගෙනහිර පළාත හා උතුරු පළාතේ සිංහල බෞද්ධ උරුමය ග්‍රන්ථ මගින් පෙන්වා දෙනු ලබන්නේ මෙම චෛත්‍යයට මහානුග්ගල චෛත්‍යය හා ආකාශ චෛත්‍යය යනුවෙන් තවත් අන්වර්ථ නාම දෙකක් ඇති බවය. ඒ අනුව මෙය මහානුග්ගල චේතිය වන්නේ නම් ඓතිහාසික අතින් ඉතා වැදගත් වේ.

කාවන්තිස්ස රජු මහානුග්ගල චේතිය කරවා එහි උත්සව සඳහා මහා සංඝයා රැස් කරවා දන් දී අවසානයේ දස මහා යෝධයන් කැඳවා ගැමුණු - තිස්ස කුමාරවරුන් අතර සටනක් සිදු වුවහොත් එක් පැත්තක්වත් නොගත යුතු බවට ගිවිස ගත් බව මහාවංසයේ සඳහන් වේ. එසේ නම් කාවන්තිස්ස රජු කර වූ මහානුග්ගල චෛත්‍යය මෙය වේ. මෙහි මුල්ම සටහන තිබූ හෝර්කාට් ප්‍රදේශයේ ජනප්‍රවාද පාදක කොට ගෙන ස්තූපය කරවන ලද්දේ අනුරාධපුරයේ පාලකයෙකු වූ සූරතිස්ස රජු බව පෙන්වා දෙයි. එමගින් එහි ඉතිහාසය දේවානම්පියතිස්ස යුගය තරම් අතීතයට උරුම වේ. සුරතිස්ස රජු හා රෝහණය අතර තිබූ සම්බන්ධයන් ගැන වංසකතාවල සඳහන් නොවන්නේ මුත් ''අය ශූර තිස'' නම් කෙනෙකු ගැන පුරාණ රෝහණයේ උතුරු කොටසේ බ්‍රාහ්මී සෙල්ලිපියකින් හමු වේ. මෙලෙස කරුණු තුලනය කර බලන විට කාවන්තිස්ස රජුගේ නාමය ලාහුගල ප්‍රදේශය ආශ්‍රිත කරඳහෙළ වැනි සෙල්ලිපිවලින් ද හමුවන නිසාත් පැරණි මාගම රාජධානිය ලාහුගල දක්වා ව්‍යාප්තව තිබූ නිසාත් නීලගිරි චෛත්‍යය පුරාණ මාගම පාලකයෙකුගේ වේ. වත්මන් නීලගිරි නාමයෙන් චෛත්‍යය හඳුන්වා තිබෙන්නේ ක්‍රිස්තු වර්ෂයෙන් 7 - 9 කාල පරිච්ඡේදයේ රජ කළ මහාදාඨික මහානාග රජු බව මහාවංසයේ සඳහන් වේ. ඒ අනුව මෙම චෛත්‍යය වරින් වර ප්‍රතිසංස්කරණය වෙමින් නිර්මාණය වුවක් බව කිව හැකිය.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ගවේෂණ වාර්තා අනුව දාගැබේ. උපරිභාගය දක්නට නොමැතිව හමු වී ඇති අතර ගරාවැටුණු ස්තූපයේ මුළු උස අඩි 72 ක් ලෙසත් වටප්ප්‍රමාණය අඩි 642 ලෙසත් ගණනය කරගෙන ඇත. මුලික වාර්තා අනුව නීලගිරි චෛත්‍යය වටා තිබී ඡත්‍රයක කොටස් අනාවරණය කර තිබේ. එම නිසා චෛත්‍යය ගොඩනැගූ කාලය ද සැළකිල්ලට ගනිමින් මෙහි උපරිභාගය ඡත්‍රයකින් හා යූපයකින් සමන්විත වූ බව අනුමාන කළ හැකි වන්නේ මෙහි සාධක මෙන් ම දිසවාපී, කුඩිම්බිගල ආරණ්‍යය සේනාසන චෛත්‍යය සාධක ද පාදක කර ගණිමිනි. 2011 - 2012 වර්ෂවල කරන ලද කැණීම්වලින් චෛත්‍යය අවස්ථා දෙකක දී ඉදිකරන ලද්දක් බව තහවුරු කරගෙන ඇත. පුළුස්සන ලද ගඩොළු කැබැලි මෙන් ම සම්පූර්ණ ගඩොළු ද ඉදිකිරීම සඳහා භාවිත කර තිබේ. එසේම ප්‍රතිසංස්කරණ අවධිවල දී දාගැබ විශාලත්වයට පත්ව තිබෙන බවද තහවුරු කරගෙන තිබේ. එම කටයුතුවල දී මුල් කාලීන ස්තූපයට නව අංග වන ගලින් කළ වේදිකාවක්, පේසාවන් දෙකක්, ගල් සළපතල මළුවක් හා ගලින් කළ මල් ආසනයක් එකතු කොට ඇති බව අනාවරණය කරගත හැකි විය. කැනීම් කටයුතුවල දී ප්‍රතිසංස්කරණ අවධියේ යැයි අනුමාන කරන කොටසේ තිබී රනින් නිමකල කරඬු කිහිපයක් සොයා ගෙන ඇත. ඒවා නිර්මාණ ලක්‍ෂණ අනුව ක්‍රි.ව දෙවන සියවසට අයත් වන බව පුරාවිද්‍යාඥයින්ගේ අදහසයි. එමගින් දගැබේ ප්‍රතිසංස්කරණය ක්‍රිස්තු වර්ෂ දෙවන සියවසේ සිදු කර ඇති බව කිව හැකි ය. ස්තූපයේ උතුරු දෙසින් නටබුන් අතර කටාරම් යෙදූ ගල් මෙන් ම භාතිකාභය රජුගේ බිසව කරන ලද පූජාව සහිත සෙල්ලිපිය ද චෛත්‍යය මුලිකව නිර්මාණය ක්‍රිස්තු පූර්වයට අයත් බව සනාථ කරවයි. ස්තූපය වටා හමුවන සිරිපතුල් ගල් මගින් ද විෂධ වනුයේ ක්‍රිස්තු පූර්ව යුගයේ නිර්මාණ ලක්‍ෂණය.

ස්තූපය ආශ්‍රිත විශාල ගොඩනැගිලි,තැන තැන විසිරුණු ගඩොල් ගොඩවල්, ගල් කණු . පිළිම ගෙවල්, ශෛලමය පිටගැට පෙළවල් සහිත ආරාම, බිතු සිතුවම් සහිත ලෙන් ගුහා, පැරණි පොකුණු, වැව් කර්මාන්ත ඇතුළු අවශේෂ රාශියක් පවති.

විශ්ලේෂණාත්මක අධ්‍යයනයේ දී නීලගිරි චෛත්‍යය මෙහි ප්‍රධාන අංගය වන බවක් බෞද්ධ විහාරාරාම නටබුන් සංකීර්ණයක එය පිහිටා ඇති බැවින් එය බෞද්ධයන්ගේ වන්දනාමානයට පාත්‍ර විය යුතු බව මෙන්ම ඓතිහාසික වටිනාකමක් සහිත ස්තූපය මෙන්ම අනෙකුත් ස්මාරක විධිමත් ක්‍රමවේදයක් යටතේ ගවේෂණ, කැනීම්, සංරක්‍ෂණය, වලට යොමු කිරීම තුළින් ලෝකවාසින්ගේ නැරඹුම් මධ්‍යස්ථානයක් බවට ද පත් කළ හැකි ය. පර්යේෂණ වලින් හෙළි නොකළ ස්මාරක මේ ආශ්‍රිත භූමියේ තවමත් මිහිදන්ව තිබේ. වගකිව යුතු ආයතන මාර්ගයෙන් මෙකී උරුමය ආරක්‍ෂාවට පියවර යෙදිය යුතුය. විද්‍යාමාන සමස්ත පුරාවිද්‍යාත්මක අවශේෂ මගින් අතීත රෝහණයේ විශිෂ්ටතම කලා හැකියාව පෙන්නුම් කරන බව අනාවරණය වුවා සේම නැගෙනහිර පළාතේ බෞද්ධ උරුමයේ මෙය තවත් සුවිශේෂී ස්ථානයක් බව නිගමනය කළ හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ


මේධානන්ද හිමි, එල්ලාවල., (2003) ***නැගෙනහිර පළාත හා උතුරු පළාතේ සිංහල බෞද්ධ උරුමය.*** දයාවංශ ජයකොඩි සහ සමාගම. මරදාන.

විජේබණ්ඩාර, ක්‍රිෂ්ණා., ලක්බිම. 2012.04.27, *නීලගිරියෙන් මතුවන ඉපැරණි රුහුණේ ශ්‍රී විභූතිය.*

ජනක පුෂ්පකුමාර. ආර්. (2016) *ඓතිහාසික නීලගිරි චෛත්‍යය හා ඒ ආශ්‍රිත පුරාවිද්‍යාත්මක වැදගත්කම,* **පුරාවිද්‍යා ශාස්ත්‍රීය සංග්‍රහය මංගල කලාපය (2016).** පුරාවිද්‍යා අධ්‍යයන අංශය. ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය.